# ළඳුනේ



දෙහන්සා හුලංගමුව

# ළඳුනේ

-ගීත විචාරය

*සොඳුරු ගීයක අරුත සොයා*


## දෙහන්සා හුලංගමුව

මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර - 12 ශ්‍රේණිය

ළඳුනේ

© දෙහන්සා හුලංගමුව

ISBN : 978-624-211-222-0

කෘතිය පළ කළ දිනය : 2026.05.10

# පිදුම

*ගී තනු සවන වැකීම පමණක් ගී*
*රසවින්දනය යයි සිතා*
*සංතෘප්තියට පත් නොවන,*
*එහි පසුබිම හා සැබෑ අරුත කෙරෙහි*
*කුතුහලය දක්වන,*
*සහෘද ගීත රස්වින්දකයන් සියලු දෙනාට*
*ආදරයෙන් !*

# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකි ය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත් කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවර ද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධන අරමුණු කොට ගෙන පොත් ලියන්නට යොමු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩම කරවූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන්ට මග පෙන්වූ ගුරවරුන් ඇතුළු සැමට ස්තුතිය පුද කරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව<br>
2026.05.10

ඉපැරණි කලාකරුවා වූ කලී, දියුණු ශිෂ්ටාචාරයක ජීවත්වන මිනිසාට වැදගත් වූත්, සමාජයට අවශ්‍ය වූත්, එක් එක් කාලයට උචිත වූත්, නිර්මාණ ඉදිරිපත් කිරීමෙහි ලා සහජ දස්කම් දැක්වූවෙකි. එය සංගීත කලාවට වුවද පොදු වූ කරුණක් බව පැරණි ගීත ශ්‍රවණය කිරීමෙන් ප්‍රත්‍යක්ෂ කරගත හැකි ය. සාහිත්‍යාංග රැසකට, විශේෂයෙන් ම ගීතවලට ප්‍රධාන ම මාතෘකාවක් වූ 'ගැහැනිය' කෙරෙහි ආදරය හෝ විරහව හෝ ශෘංගාරය ජනිත කරවන තේමාවලින් බැහැරව, සානුකම්පිත දෘෂ්ටියක් හෙලන්නා වූ "ළඳුනේ" ගීතය, අධිනීතිඥ රංබණ්ඩා සෙනෙවිරත්න මහතා අතින් පබැඳුණු, ගීත විචාරකයින් අතර අතිශය පැසසුමට ලක්වුණු එබඳු ගීතයකි. ඕනෑම පදවැලක් ශ්‍රාවක ආකර්ෂණය දිනාගැනුමට නම් එමගින් ඉදිරිපත් කෙරෙන අදහස වඩාත් හැඟුම්බරව ගීතයක් බවට ගොඩනැංවිය යුතුය. එම භාරදූර කාර්යයෙහි නියැළුණු සුප්‍රකට සංගීතඥ ප්‍රේමසිරි කේමදාස මහතාත්, එම ගීතයෙන් ප්‍රකාශ වන හැඟීම් නියමාකාරව ගායනා කළ අති දක්ෂ ගායක අමරසිරි පීරිස් මහතාත් තම වගකීම ඉතා මැනවින් ඉටු කර ඇති බවට හොඳම සාක්ෂ්‍යය එම ගීතය ප්‍රබුද්ධ ශ්‍රාවකයින් අතර මෙතරම් ආදරයටත් ගෞරවයටත් පාත්‍ර වීම ම නොවේද? වේශ්‍යාවක් දෙස මෙතරම් අනුකම්පාවකින් බැලීමට සමත් වූ වෙනත් ජගතෙකු සිටී ද?

“ළඳුනේ” ගීතය හරහා ස්ත්‍රීත්වයේ අසරණභාවය අව්‍යාජත්වයෙන් නිරූපණය කරමින් වේශ්‍යාවක කෙරෙහි

සානුකම්පිත දෘෂ්ටිකෝණයකින් බැලීමට ශ්‍රාවකයා යොමු කරයි. එම අදහස වඩාත් තහවුරු කිරීමට මෙම ගීතය ලිවීමට පාදක වූවා යැයි සැලකෙන සිද්ධිය ඉදිරිපත් කිරීම මැනවැයි සිතමි. දිනක් අධිනීතිඥ රංබණ්ඩා සෙනවිරත්න මහතාට තම නඩු කටයුත්තකට මහනුවර උසාවියට පැමිණීමට සිදුවී තිබිණ. තම මිතුරෙක සමඟ තම වාහනයේ ගමන් කරමින් සිටි ඔහුගේ නෙත ගැටෙන්නේ තරමක් දුහුල්, සුදු පැහැති ඇඳුමකින් සැරසී, කොණ්ඩය ලිහා දමා සිටින අතිශය රූමත් තරුණියකි. ඇය පිළිබඳ තම සගයාගෙන් කරුණු විමසූ ඔහුට දැනගැනීමට ලැබුණේ එම තරුණිය වීදි ගණිකාවක් බවයි. නමුත් ඔහුගේ සිත වඩාත් සසල කිරීමට සමත් වූයේ ඇය මේ වන විටත් එක්දරු මවක් ය යන පුවත ශ්‍රවණය වීමයි. තමාට මේ ස්ත්‍රිය පිළිබඳ අනුකම්පාවක් ඇති වුවත් තම මිත්‍රයාගේ කරුණු දැක්වීමට අනුව මුළු සමාජයම ඇය දෙස බලන කෝණය පිළිබඳ අමුතුවෙන් සිතීමට ඔහුට අවශ්‍යතාවයක් නොවීය. එම තරුණිය කෙරෙහි සිතේ ඇති වූ බර දරාගෙන දිනය ගෙවා දමා, නැවත තම තාවකාලික නිවහන වෙත යන ඔහු දකින්නේ සුදු ඔසරියකින් සැරසී සුදු මල් පිරුණු වට්ටියක් අත දරා දළදා මාලිගය දෙසට පියනගන එම "වේශ්‍යාව"යි.  තමා උදැසන සවන් දුන් තම මිතුරාගේ කතාවට අනුව මේ ඇයගේ සුපුරුදු දින චර්යාවේ අංගයක් බව ඔහුගේ සිහියට නැගිණ. ඇ අන් කිසිදු සරණක් නැතිව බුදු සරණ පමණක් ඉතිරිව ඇති තත්ත්වයකට පත්ව සිටිනු දුටු ඔහුට ඇ වෙනුවෙන් කුමක් හෝ සිදු කළ යුතු ය යන්න හැඟී ගියෙන් එදින සවස ම "ළඳුනේ" ගීතය ලිවීම ආරම්භ කළේ ය.

“ළඳුනේ... ළඳුනේ...
ඔබේ දෑස දැක ගත්තෙමි
සැඳෑ කලෙක ළඳුනේ … ළඳුනේ …”

සෙනවිරත්න කලාකරුවා තම පදවැල ලිවීම ආරම්භ කරන්නේ ම මෙම ගණිකා වෘත්තියේ නියැලෙන ස්ත්‍රිය වෙනුවෙන්

තම කනගාටුව ප්‍රකාශ කරමිනි. ඇත්තකි, ඇය වෙනුවෙන් කනගාටුව ප්‍රකාශ කිරීම විනා ඔහු හට ඇය වෙනුවෙන් කළ හැකි යමක් නොවිණ. ගීතයේ සඳහන් වන සැඳෑ කාලය නම්, ඔහු ඇය දළදා මාලිගාව වෙත පිය මනිනු දුටු සන්ධ්‍යාවමයි. ඇගේ දෑසේ දක්නට තිබූ දුක, අසරණකම, සමාජය කෙරෙහි ඈ තුළ ඇතැයි සිතිය හැකි වෛරය, තමාගේ අසරණභාවය පිළිබඳ තමා තුළ ම වූ කලකිරීම, ආදී හැඟීම් රාශියක් ඔහු දකින්නට ඇත. ඔහු ඒ හැඟීම් එකක් පාසාම මතකයට නඟාගෙන මෙවන් ගීතයක් රචනා කරන්නට ඇත. කිමද යත් මෙම ගීතය එවන් වූ දහසකුත් එකක් හැඟීම්වලින් පෝෂණය ලබා ඇත.

“දෙනෝදහක් අත ගත්තද
සැමියෙකු නැති ළඳුනේ
නෑයෙක් නෑකම් නොකියන
වීදි සරන ළඳුනේ”

මේ නමක් ගමක් නොදන්නා ස්ත්‍රිය කාගේ කවුරුද යන වග දන්නේ කවරෙකු ද? සත්තකින් ම ඈ පමණකි. කිමද යත් ඇයට සැමියෙකු නැති; නෑදෑයෙකු නැති; මිතුරෙකු නැති; තමාට තමාත් තම දරුවාත් පමණක් ඉතිරිව ඇති බව ඇගේ විශ්වාසය වන බව ද නොඅනුමාන ය. දෙනෝදහක් පිරිමින් ඇගේ පහසට ආශා කළ ද, ඇයට ආදරය කළ කිසිවකු නැති. නොඑසේනම් ඇය තවමත් වේශ්‍යා වෘත්තියේ නියැලීමට කරුණු කිම් ද? එසේම ඈ වැනි ළදකට නෑකම් කීමට කවරෙකු හෝ ඉදිරිපත් වෙතොත් ඒ මීළඟ ලෝක පුදුමය වනු ඇත. ඉතින් ඇයට උරුම අසරණකම පමණකි. තමාගේ ලෙඩකට දුකකට වුවද තමා අසල රැඳී සිටීමට කිසිවකු නැති සාංකාව ඇයට කොතරම් වේදනාවක් ගෙන දෙන්නක්ද යන වග දන්නේ ද ඇය පමණකි. නමුත් ඒ පිළිබඳ කිසිවකුට පැමිණිලි කළ නොහැකි ය. කිමද යත් මේ කැමැත්තෙන් හෝ අකමැත්තෙන් ඇය විසින්ම තෝරාගත් දෛවයයි. තම ලෙයින් උපන් දරුවාට දිවිය දීමේ උතුම් පරමාර්ථය සාක්ෂාත් කර ගැනීමට ඇය මේ වෘත්තියේ

තියැළෙන්නේ ද යනවග දන්නේත් ඇයම පමණකි. ස්ත්‍රියකට, පියකු නොමැති දරුවකුගේ මවකට, සමාජයෙන් මීට වඩා වැදගත් ස්ථානයක් ලබා දෙතැයි සිතීමට ද නොහැකි ය.

"බුදුන් දැක නිවන් දකිමැයි
දෙව්රම යන පාර අහන
ඔබ ද පටාචාරාවකි
ඔබ ද කිසාගෝතමියකි"

මෙම පදවැලේ නිර්මාතෘවරයා, තමාගේ අසරණකම පිටතට නොපෙන්වා සිත තුළ සිරකරගෙන සිටින මෙම ස්ත්‍රිය වෙනුවෙන් තම හඬ නගා, ඇය පත් වී ඇති අසරණ තත්ත්වය ලොවටම පෙන්වා දී ඇයට පිළිසරණක් ලබාදීමට උත්සාහ කරයි. ඒ තුළින් ඈ වෙත එල්ල වන විවේචන වල අඩුවක් සිදු වෙතැයි ඔහු අපේක්ෂා කරන්නට ඇත. ඔහුගේ පරිකල්පනයට අනුව යට කී අයුරින් සෑම දිනකම දළදා වැඳීමට යෑමේ බලාපොරොත්තු කුමක්දැයි ඇගෙන් අසන පැනයට ඇය පිළිතුරු බඳින්නේ "මේ මහා කරුම වෘත්තියෙන් මට ඊළඟ ආත්මයේ දී වත් මිදෙන්න පුළුවන් වෙන්න ඕන" යනුවෙනි. සමාජය විසින් මේ ස්ත්‍රිය වෙත නඟන චෝදනා සියල්ල ම පාහේ සුනුවිසුණු කොට දැමීමට රචකයා තම උපරිම උත්සාහය දරා ඇති බව මින් පැහැදිලි වේ. තවද බුදු දහමේ සඳහන් වන පටාචාරා සහ කිසාගෝතමී යන චරිත ද්විත්වයෙන් ප්‍රබල සංකේත මැවීමටද රචකයා සමත් වී ඇත. බුද්ධ කාලයේ තම ජීවිත වරද්දා ගත් පටාචාරා, කිසාගෝතමී වැනි අයට තම ජීවිත නැවත නිවැරදි මාර්ගයට ගෙන යාමට බුදුරජාණන් වහන්සේගේ උපදෙස් සහ මග පෙන්වීම් ලැබී ඇත. නමුත් මෙම වීදි ගණිකාවට උපදෙස් ලබාදීමට, ඇයව තේරුම් ගෙන ඇයට ජීවිතය නැවත ගොඩනගා ගැනීමට උපකාර කිරීමට බුදුවරයකු කොහි ද? ඈ කෙතරම් අසරණ ද? ඇයට පිළිසරණක් කොහේ හෝ වේ ද? නැත. අපට ඇගේ අසරණකම පිළිබඳ ගොඩනැගිය හැක්කේ හුදෙක් උපකල්පනයක්

පමණකි. ගීතයෙහි සඳහන් වන ගැහැණියට අමතරව මෙවන් දුක් දොම්නස්වලට ගොදුරු අන්ත අසරණභාවයට පත් තවත් ස්ත්‍රීන් ඉහේ කෙස් ගණනට මෙම සමාජයේ ජීවත් වන බව නිසැක ය.

සෑම අතින්ම අසරණ භාවයට පත්ව සිටින මෙම වීදි සරණ ස්ත්‍රිය දෙස සමාජය බලන්නේ ද තවත් අඩියකින් හෝ ඇය පහතට තල්ලු කිරීමේ අටියෙනි. මැය පමණක් නොව කිසියම් අඩුපාඩුවක් දැක ගත හැකි සෑම පුද්ගලයකු ම හැකි උපරිමයෙන් පහතට ඇද දැමීමට බලා සිටින තරමට ම සමාජය පිරිහී ඇති බව කාටත් නොරහසකි. තමාගේ අසරණ භාවය කෙරෙහි කලකිරී සිටින මෙම ස්ත්‍රිය ද හැකි තරමින් පහතට හෙලා කතා කරන සමාජය වෙත නිර්මාණකරුවා එල්ල කරන්නේ සුළුපටු විවේචනයක් නොවේ.

“තෙල් මල් ගෙන දෝත පුරා
මුනි කුටියට පියමං වන
ඔබේ දෑස දැක ගත්තෙමි
සැදෑ කලෙක ළඳුනේ”

ගීතය තුළ මෙම වීදි ගණිකාවගේ පාපොච්චාරණයකින් ඇගේ අසරණභාවය පෙන්නුම් කිරීමෙන් නොනැවතුණු රංබණ්ඩා සෙනවිරත්න මහතා, බුදු සරණ යාමට සැරසෙන ඇයට සමාජයෙන් එල්ල වන ගැරහුම් ද තම ගීතය තුළින් ඉදිරිපත් කරන්නේ සමාජය ඇය දෙස බලන පොදු කෝණය විවේචනය කරමිනි. ගීත රචකයා විසින් මේ වීදි සරණ ස්ත්‍රී කෙරෙහි කුමන ප්‍රතිරූපයක් මවා පෑමට උත්සාහ කළත් සමාජය, සමාජය ම වන බව ඔහු ද හොඳින් දන්නා කරුණකි. කිනම් හෝ පුද්ගලයෙකු සමාජ සම්මතයන්ට විරුද්ධව එක් වරක් හෝ ක්‍රියා කළහොත් ඔහු කරන අනෙක් දහසකුත් යහපත් දේ දෙස ද සමාජය බලන්නේ වැරදි කෝණයකින් ය. වේශ්‍යාවකැයි නම් පටබැඳුණු කතිකාවට ලක්වෙන මෙම ගැහැනිය බුදුන් වැදීමට දළදා මාලිගයට පියමනිනු දකින සමාජයෙන් ඇයට හිමිවන්නේ, "ඕකි යන්න පුළුවන් හැම අටමගලෙ ම ගිහිල්ලා දැන්

යනවා පත්තිනි අම්මා වගේ බුදුන් වදින්ඩ" යනාදී කඨෝර වචන පෙළකි. මෙම සිද්ධිය ගීතය රචනා වූ කාලයට පමණක් නොව වර්තමානයටත් පොදු වූ කරුණක් බව සමාජය හා ගැටෙන ඕනෑම කෙනෙකුට ප්‍රත්‍යක්ෂ කරගත හැකි ය. සත්තකින්ම මනුෂ්‍යත්වය යටපත්ව එකිනෙකා කෙරෙහි වෛරය, ඊර්ෂ්‍යාව, ආත්මාර්ථකාමීත්වය, ආදී වූ ක්ලේශ සහගත සිතිවිලි වැජඹෙන්නා වූ සමාජයෙන් වෙනත් කුමක් හෝ යහපත් ප්‍රතිචාරයක් බලාපොරොත්තු විය හැකිද?

“ළැම පමණක් ලොවට පෙනෙන
ළය නොපෙනෙන ළදුනේ”

සමාජය, පුද්ගලයකු විවේචනය කිරීමට තෝරා ගන්නේ ඔහුගේ හෝ ඇයගේ බාහිර ස්වරූපය පමණක් දැනගෙන විනා ඇතුළාන්තය පිළිබඳ අංශු මාත්‍රයක දැනීමකින් තොරව ය. මේ වීදි සරන ස්ත්‍රිය කෙරෙහි සමාජය සපයන අර්ථකථනය ද එබන්දක් ම වන බව නිර්මාණකරුවා නැවත වරක් පෙන්වා දෙන්නේ කිසිදු පුද්ගලයෙකුට චරිත සහතික දීමට සමාජයට අයිතියක් නැති බව පසක් කරමිනි. මේ වේශ්‍යාවකැයි නම් ලද ස්ත්‍රිය සත්‍ය වශයෙන්ම එම තත්ත්වයට පත්වීමට හේතු දන්නේ ඇයි ම පමණකි. ඇතැම් විට ඇයට තිබෙන එකම බලාපොරොත්තුව, තම දරුවා පෝෂණය කර සමාජයේ පිළිගත් තැනකට යනු දැකීම වන්නට ඇත. එසේ තිබියදීත් සමාජය ඇගේ බාහිර පෙනුම පමණක් "ළැම පමණක්" සැලකිල්ලට ගෙන ඇයට මුළු ජීවිතය ම එපා කරවන තත්ත්වයට පත්කර ඇත්තේ ඇගේ "ළය" නොදැක ය. ඇගේ පරමාර්ථය නොදැක ය.

පෙර සඳහන් කළ තේමා වලට අමතරව මෙම ගීතය තුළින්, පුරුෂයන් භුක්ති විඳින අසීමිත නිදහසත්, ඒ හේතුවෙන් කාන්තාවන් කෙතරම් පීඩනයකට පත් වී ඇත් ද යන්නත්, සාකච්ඡා කිරීමට රංබණ්ඩා සෙනවිරත්න මහතා අවස්ථාව සලසා ගෙන

ඇත.

“පිරිමින්ගේ පාප කඳට
දෝස විඳින ළඳුනේ
අඳුරේ පව් කරන දනා
එළියේ රවන ළඳුනේ”

පුද්ගල අයිතිවාසිකම් ලිංග භේදයකින් තොරව බෙදී යන්නේ යැයි පැවසුවද සත්තකින්ම සමාජයේ වැඩි හරියක් ගැරහුම් ලබන්නා වූ කාණ්ඩය කාන්තාවන් ය. එය අතීත සමාජයට පමණක් නොව වර්තමානයට ද පොදු වූ කරුණකි. මෙම තරුණිය ද සමාජයෙන් ගැරහුම් ලබන්නා වූ වරද ඈ තනිව සිදුකරන ලද්දක් ද?

තනි අතින් අත්පුඩි ගැසීම සිදු කළ නොහැක්කා සේ ම මේ වීදි ගණිකාව මෙම තත්ත්වයට පත්වීම ද ඈ තනිව සිදු කරන ලද්දක් නොවේ. ඇසුරු කිරීමට පැමිණෙන පුරුෂයන් නොපැමිණියහොත් ඈ තවදුරටත් ගණිකාවක බවට පත්වන්නේ ද? නමුත් සමාජයෙන් ගැරහුම් ලබන්නේ ඇය පමණකි. ඇසුරු කරන පුරුෂයන්ගේ පව් වලට ද කර ගැසීමට සිදුවන්නේ මේ ගැහැණියට පමණකි. තම ධාතුවෙන් ඇයගේ දරුවා හැදීමට උපකාර කළ පිරිමියා එම දරුවා වැඩීමටත් උපකාර කළා නම් ඇය සෙනෙහෙබර මවකගේ තනතුරින් පිදුම් ලැබීමට ඉඩ තිබිණ. නමුත් දෛවයේ සරදමට මෙන් ඈ සදහටම ගණිකාවක බවට පත් කිරීමටත්, පියකු අහිමි දරුවෙකුගේ මවක බවට පත් කිරීමටත්, සමාජයෙන් එල්ල වන ගැරහුම් වලින් ප්‍රහාරයට ලක්වන වේශ්‍යාවක බවට පත්කිරීමටත්, සමාජයෙන් පුරුෂයන්ට හිමිවී තිබෙන අසීමිත නිදහසට හැකියාව ලැබී ඇත. මේ පිළිබඳ නිර්මාණකරුවා දක්වන ආකල්පය ගීතයට සවන් දීමේ දී අමරසිරි පීරිස් මහතා හඬ තීව්‍ර කරමින්, ආවේගාත්මකව ගායනා කරන අන්දමට ශ්‍රාවක මනසට තදින් කාවැදෙනු ඇත. මෙහි හාස්‍යයට කාරණය වන්නේ රාත්‍රී අඳුරේ

ඇගේ පහස සොයා ඇඹලයන් මෙන් ඇදෙන පුරුෂයන් ම දහවල් ආලෝකයේ ඇගේ චරිත ඝාතනයට තම උපරිම සහයෝගය දැක්වීමයි. මෙවන් අකටයුතුකම් දැක දැක සුසුම් හෙළීමට සිදුවන සෙනෙවිරත්න මහතා වැනි සියලු දෙනාට බලාපොරොත්තු තැබිය හැකි එකම කාරණය නම්, කර්මය පමණක් ම ය.

"කුහුඹුවකුට වරදක් නැති
වැරදිකාර ළඳුනේ"

ඉතින්, ගීතය අවසාන ය. නමුත් ගීතයෙහි කියවුණු 'ඇය'ගේ ජීවිත කතාව අවසාන ද? ගීතය තුළින් ඇයව කොතරම් සාධාරණීකරණය කිරීමට උත්සාහ කළ ද සමාජයෙන් ඇයට සමාවක් ලැබෙනු ඇත් ද? අධිනීතිඥ රංබණ්ඩා සෙනවිරත්න මහතා, ශ්‍රේෂ්ඨ සංගීතඥ ප්‍රේමසිරි කේමදාස මහතා සහ සදාකාලික ප්‍රේමණීය කටහඬකට උරුමකම් කියන අමරසිරි පීරිස් මහතා යන දැවැන්ත පෞරුෂ ත්‍රිත්වය ඒ සඳහා දරූ උත්සාහය කෙතරම් දුරට මල්ඵල ගැන්වී ඇත් ද? එය තීරණය කරන්නේ මෙම හැඟුම්බර ගීතයෙහි සදාකාලික රසිකයන් වන ඔබත්, මමත්, මේ සමාජයත් නොවේ ද? මේ කුහුඹුවකුටවත් වරදක් නොකළ වැරදිකාර ස්ත්‍රියගේ සදොස් නිදොස් බව තීරණය කිරීම සමාජයටම බාර කරමි.

මේ ගීතය පිළිබඳ මාගේ පෞද්ගලික අදහස පමණක් ඉදිරිපත් කිරීමට වග බලාගමි. මේ අසරණ කාන්තාව සිය සම්පූර්ණ කැමැත්ත ඇතිව ආශාවන්ට වහල් ව මෙම රැකියාව තෝරාගන්නට ඇතැයි මම නොසිතමි. එබැවින් ගීත රචකයාගේ අදහසට එකඟ වෙමි. සමාජයෙන් ගැරහුම් ලබන කාත් කවුරුවත් නැතිව තම දරුවා සමග තනිව ජීවත්වීමට සිදුවී ඇති ඈ කෙරෙහි මගේ සිතේ හට ගන්නේ අනුකම්පාවකි. ප්‍රබුද්ධ ගීත ශ්‍රාවකයන් බොහෝ දෙනාගේ අදහස ද මෙයම වන බව සමාජය කියවීමේ දී හැඳින ගත හැකි ය. සමස්ත සාමාජය ම එක් පුද්ගලයකු දෙස බලන

කෝණයෙන් මිදී සම්පූර්ණයෙන්ම වෙනස් අදහසක් ඔස්සේ එම පුද්ගලයා දෙස බැලීමට ශ්‍රාවකයා යොමු කරවන ලදුනේ ගීතය එම කාර්යයෙහි උපරිම සාර්ථකත්වයට පැමිණ ඇති බව මාගේ මතයයි.

ගීතයට පාදක වූ සිදුවීම් පෙළත් ගීතයේ ගැඹුරු අර්ථයක් විමසා බැලීමේ දී අපට මේ වීදි සරණ ස්ත්‍රිය කෙරෙහි අනුකම්පාවක් ඇති වන්නේ නිරායාසයෙනි. නමුත් මෙම ගීතය තුළින් කියවෙන කතාව නොදන්නා, මෙම ගීතය කෙරෙහි සංවේදී නොවන පුද්ගලයන් තවමත් ඇය කෙරෙහි දක්වන්නේ වැරදි ආකල්පයක් නොවේ ද? පිරිසක් ඇය දෙස සමච්චල් සහගත බැල්මෙන් බලන අතර ම තවත් පිරිසක් ඇය දෙස ක්‍රෝධය පෙරදැරි කොට බලනු ඇත. කිසිවෙකුත් ඈ එම තත්ත්වයට පත් වූ අයුරු පිළිබඳ සිතා නොබලනු ඇත. ඇයට අමතරව ඇගේ කතාව දන්නා වෙනත් කවුරුත් නොසිටින බව ද කිසිවකුට මතක් නොවනු ඇත. ගීත රචකයා තම ගීතය තුළින් සමාජයට වැදගත් පණිවිඩයක් ලබාදීමට උත්සාහ කර ඇත. පිටකවරය බලා පොතක් විචාරය නොකළ යුතු සේ ම පිටින් පෙනෙන ප්‍රතිරූපයට අනුව පුද්ගලයින්ට චරිත සහතික ලබා දීමට ද සමාජයට අයිතියක් නැති බව නිර්මාණකරුවා පෙන්වා දෙන්නේ ඒ සඳහා හොඳම උදාහරණයක් ලෙස යට කී ස්ත්‍රියගේ ජීවිත කතාව ගීතය තුළින් ඉදිරිපත් කරමිනි. ඉතින්, සමාජයට පුද්ගලයන් වෙනුවෙන් චරිත සහතික ලබාදීමට නොහැක්කා සේ ම මෙම ගීතයේ අදහසට ඔබ සම්පූර්ණයෙන් එකඟ විය යුතු යැයි කීමට මට ද හැකියාවක් නැති. මෙවන් සදාකල් අමරණීය ගීත තව චිරාත් කාලයක් වැජඹේවා යන ප්‍රාර්ථනය පමණක් අවසානයට එක් කරමි.

ළඳුනේ ... ළඳුනේ ...
ඔබේ දෑස දැකගත්තෙමි
සැඳෑ කලෙක ළඳුනේ ... ළඳුනේ ...

දෙනෝ දහක් අත ගත්තද
සැමියෙකු නැති ළඳුනේ
නෑයෙක් නෑකම නොකියන
වීදි සරණ ළඳුනේ ... ළඳුනේ ...

තෙල් මල් ගෙන දෝත පුරා
මුනිකුටියට පියමං වන
ඔබේ දෑස දැක ගත්තෙමි
සැඳෑ කලෙක ළඳුනේ ... ළඳුනේ ...
බුදුන් දැක නිවන් දකිමැයි
දෙව්රම යන පාර අහන
ඔබ ද පටාචාරාවකි
ඔබ ද කිසාගෝතමියකි

පිරිමින්ගේ පාප කඳට
දෝස විඳින ළඳුනේ
අඳුරේ පව් කරන දනා එළියෙ රවන ළඳුනේ
ළැම පමණක් ලොවට පෙනෙන
ළය නොපෙනෙන ළඳුනේ
කුහුඹුවකුට වරදක් නැති
වැරදිකාර ළඳුනේ

ගායනය : අමරසිරි පීරිස්
පද රචනය : අධිනීතිඥ රංබණ්ඩා සෙනවිරත්න
සංගීතය : ප්‍රේමසිරි කේමදාස

ගීතයට සබැඳිය

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කරවීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වා දෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකි නිසාය. තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වා ගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උර දී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි. මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමේ තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්<br>(ව්‍යාපෘති නිර්මාතෘ)